THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

NOT FOR SALE

KE 4 – Processes, Assurance & Ethics

සැප්තැම්බර් 2018

All Rights Reserved

<u>1 වන කොටස</u>

<u>පිළිතුරු 01</u>

1.1

ඉගෙනුම් ඵලය: 1.1.3	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 15-16	
නිවැරදි පිළිතුර: **A**	

1.2

ඉගෙනුම් ඵලය: 1.7.1	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 66	
නිවැරදි පිළිතුර: **C**	

1.3

ඉගෙනුම් ඵලය: 2.1.1	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 88-89	
නිවැරදි පිළිතුර: **D**	

1.4

ඉගෙනුම් ඵලය: 2.4.1	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 172	
නිවැරදි පිළිතුර: **D**	

1.5

ඉගෙනුම් ඵලය: 2.6.3	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 10 - 13 විකණම් කළමණාකරණය	
නිවැරදි පිළිතුර: **B**	

1.6

ඉගෙනුම් ඵලය: 3.1.1	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 236, 240-241	
නිවැරදි පිළිතුර: **A**	

NOT FOR SALE

1.7

ඉගෙනුම් ඵලය: 4.2.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 264, අතිරේක අධ්‍යයන උපකාරකය පිටු අංක: 72
නිවැරදි පිළිතුර: **D**

1.8

ඉගෙනුම් ඵලය: 5.3.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 314-315
නිවැරදි පිළිතුර: **A**

1.9

ඉගෙනුම් ඵලය: 5.2.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 294-297
නිවැරදි පිළිතුර: **B**

1.10

ඉගෙනුම් ඵලය: 5.5.3
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 327
නිවැරදි පිළිතුර: **A**

(2 x 10 = මුළු ලකුණු 20)

NOT FOR SALE

පිළිතුර 02

2.1

ඉගෙනුම් ඵලය: 1.2.3

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 28 - 32

වංචා පිළිබඳ අවදානම යනු බොහෝ විට ආයතනයේ සේවකයන් විසින්, හෝ ඇතැම් විට ආයතනයෙන් පිටස්තර අයෙකුගේ වංචනික ක්‍රියා නිසා වෙන් අලාභ දැරීමට සිදුවීමේ අවදානමය.

අනුකූලතා පිළිබඳ අවදානම මෙහෙයුම් අවදානමේ තවත් එක් කොටසකි. එනම් වැදගත් නීතියකට හෝ රෙගුලාසියකට අනුකූලවීමට නොහැකිවීමේ අවදානමය.

2.2

ඉගෙනුම් ඵලය: 1.4.1

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 40- 41

- අවදානම නිසා ඇතිවිය හැකි බලපෑම අවම මට්ටමක පවතින විටක.
- අහිතකර අවදානමක් සිදුවීමේ හැකියාව අවම මට්ටමක පවතින විට.
- එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අවශේෂ අවදානම ආයතනය විසින් පිළිගත හැකි සීමාව තුල පවතින විට.

2.3

ඉගෙනුම් ඵලය: 1.6.1

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 53-54

අවදානම	පාලනය
සේවකයන් ප්‍රමාණය ඉක්මවා මුදල් ඉල්ලුම් කළහැකිය.	සේවකයන් නිසි පරිදි පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍රයක් මගින් වියදම් සඳහා ගිය මුදල් ඉල්ලීම් බලයලත් නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතුය. මේවා සමඟ දරණ ලද වියදම් සනාථ කෙරෙන සාක්ෂි ලෙස ඉන්වොයිසි/බිල්පත්/ලදුපත් ඉදිරිපත් කළයුතුය. බලයලත් නිලධාරියා විසින් වියදම් ඉල්ලුම් පත්‍ර සමඟ යා කර ඇති ලියවිලි හා විස්තර පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවීම අනුමත කළයුතුය.
අනවසර පුද්ගලයන් ගොඩනැගිල්ලට ඇතුල් විය හැකිවීම.	• සියළුම අමුත්තන් පිළිගැනීමේ නිලධාරී/ආරක්ෂක නිලධාරී කුටිය වෙත වාර්තා කර අමුත්තන් සඳහා ඇති ලේඛනයේ අත්සන් කළයුතුය. අනතුරුව අනුමත පුද්ගලයන් විසින් අමුත්තා කැටුව යා යුතුය. • ආරක්ෂිත කැමරා උපයෝගී කරගෙන ගොඩනැගිල්ල තුල පුද්ගලයන් එහා මෙහා යාම් නිරීක්ෂණය කිරීම. • ගොඩනැගිල්ලේ සියළු අතිරේක දොරවල් අගුලු ලා වසා දැමීම හා ඒවා යතුරු බාරව සිටින අවසරලත් නිලධාරීන් විසින් පමණක් විවෘත කිරීම.

NOT FOR SALE

2.4

ඉගෙනුම් ඵලය: 1.9.1

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 68-69

අභ්‍යන්තර විගණකයන් පාලන පද්ධති විමර්ශනය කර ඔවුන්ගේ සොයාගැනීම් හා නිර්දේශ කළමණාකරත්වයට, විගණන කමිටුවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

බාහිර විගණකයින් වාර්ෂික විගණන ක්‍රියාවලියේ කොටසක් ලෙස අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලත්වය පිළිබඳව අවධානය යොමුකරයි. එහිදී ඔවුන් විසින් සොයාගනු ලැබූ මූල්‍ය අභ්‍යන්තර පාලන දුර්වලතා කිසිවක් ඇත්නම් ඒවා කළමණාකාරිත්යට හා විගණන කමිටුව වෙත වාර්තා කළයුතුය.

බාහිර හා අභ්‍යන්තර විගණකයන් අභ්‍යන්තර පාලනයන් පිළිබඳව තොරතුරු හා නිර්දේශ කළමණාකාරිත්වයට සපයන නමත් ඔවුන්ට අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් සෘජු වගකීමක් නොමැත.

2.5

ඉගෙනුම් ඵලය: 2.3.3

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක:149, අතිරේක අධ්‍යායන උපකාරකය පිටු අංක: 51-60

- මුදල් ලාච්චුවක තබාගන්නා බැවින් මුදල් සොරකම් කළ හැකිය.
- මාසික සුළු මුදල් ප්‍රතිපූර්ණය රු. 50,000 ක් පමණ වන බැවින් රු. 200,000 ක සුළු මුදල් අග්‍රිමය අතිශයින් වැඩිය.

2.6

ඉගෙනුම් ඵලය: 2.6.1

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: විකණුම් කළමණාකරණය පිටු අංක:3

නව ගනුදෙනුකරුවාගේ මූල්‍ය තතත්වය තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණවත් නැත. ණය අවදානම සමාලෝචනය කිරීම සඳහා ගණුදෙනුකරුගේ වර්තමාන හා අතීත මූල්‍ය ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ව්‍යාපාර සැලසුම් ලබාගත යුතුය.

2.7

ඉගෙනුම් ඵලය: 3.3.1

අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 245-250

පරිගණකගත තොරතුරු පද්ධතියක් තුල ඇති අභ්‍යන්තර පාලනයන් , පරිගණක පද්ධතිය අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මකවන බවට සහ එහි අරමුණු සඵලදායිව ඉටුකර ගනු ලැබේද යන්න පිළිබඳ සාධාරණ සහතිකවීමක් සැපයීම සඳහා අත්‍යවශ්‍ය වේ. බොහෝ පරිගණකගත පොදු පාලනයන් ස්වභාවයෙන් ක්‍රියා පටිපාටිමය ස්වරූපයක් ගනී.
ඒවා සියළුම පරිගණක යෙදුම්වලට අදාළ අවදානම් ගැන දැනුවත් භාවයක් ඇති කිරීමට සහාය වේ. එමෙන්ම ඒවා පරිගණක යෙදුම් ක්‍රියාවට නැංවීමේදී සීමිත අවදානමක් යටතේ ඉටුකරන බව තහවුරු කර ගැනීමටද අවශ්‍යවේ.
පරිගණකගත යෙදුම් පාලනයන් යනු පරිගණකගත පද්ධතිය තුලින් ජනිත කෙරෙන දත්ත හා වාර්තාවල අවංකභාවය (integrity) තහවුරු කර ගැනිම සඳහා නිර්මාණය කළ වැලැක්විම්මය (preventive) හෝ හෙළිදරව් කරන සුළු (detective) පාලනයන්ය.

NOT FOR SALE

2.8

ඉගෙනුම් ඵලය: 4.2.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 270
ගණකාධිකාර්වරයකු තමා සේවයේ යොදවා ඇති සමාගමේ හෝ ආයතනයේ තොරතුරුවල රහස්‍යභාවය රැකිය යුතුය. ඔවුන් තමා යටතේ සේවයකරන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් තොරතුරුවල රහස්‍යභාවය පිලිබඳ මූලධර්මය රකින ආකාරයෙන් කටයුතු කරන බැව් තහවුරු කරන සාධාරණ සියලු පියවර ගත යුතුය.

2.9

ඉගෙනුම් ඵලය: 5.5.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 319 - 323
විගණන පරීක්ෂණවල ස්වභාවය යනු පාලන පරීක්ෂාවන් (tests of controls) සහ තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටිවල එකතුවකි. තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි - සනාථ කිරීම් කැඳවීම/ පසුකාලීන ගෙවීම් පරීක්ෂා කිරීම සහ වෙන් කිරීමේ පිළිවෙත සැසඳීම, ණය නේවාසික කාලය වැනි වෙනත් පිළිගත හැකි කරුණු. පාලන පරීක්ෂණ - සියළුම ඉන්වොයිසි හා බැරපත් අනුමත කර තිබේදැයි බැලීම සහ විකුණුම් ඉන්වොයිසි හා බැරපත් අනුපිළිවෙලට අංකකර තිබේදැයි බැලීම..

2.10

ඉගෙනුම් ඵලය: 5.5.4
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 318-319
විගණන සාක්ෂිවල යෝග්‍යත්වය යනු එහි ගුණත්වය පිළිබඳව කරන මැනීමකි. එනම් විගණකවරයාගේ මතයට පදනම්වන නිගමණයන් තහවුරු කිරීම සඳහා ඒවා කොතෙක් දුරට අදාළද යන්න සහ විශ්වාසවන්තභාවයෙන් යුක්තද යන්නය.

(මුළු ලකුණු 30)

NOT FOR SALE

2 කොටස

පිළිතුර 03

ඉගෙනුම් ඵලය: 1.5.2, 1.9.1
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 50, 51, 68

(a) කොසෝ (COSO) අභ්‍යන්තර පාලන පද්ධති ආකෘතියට සංරචක පහක් ඇත:

1. **පාලන පරිසරය** - මෙයින් අදහස් කරන්නේ ආයතනයේ පවතින සංස්කෘතිය හා අවදානම් සම්බන්ධයෙන් එය දක්වන ආකල්පයයි. අවදානම් පිළිබඳව දැනුවත්වූ ආයතනික සංස්කෘතයක් ආයතනයේ නායකයන් විසින් බිහිකරනු ලබන අතර එමගින් ඔවුන් ආයතනයේ සෙසු සියළුම සේවකයන්ට ආදර්ශයක් ලබාදිය යුතුය. අවදානම් කෙරෙහි දක්වන ආකල්ප මත හා අවදානම කෙරෙහි එහි සේවකයන්ගේ දැනුවත්භාවය මත අභ්‍යන්තර පාලන පද්ධතියක සඵලදායිත්වය රඳා පවතී
2. **අවදානම් තක්සේරු කිරීම** - මෙය අවදානම් හඳුනාගැනීමේ, විශ්ලේෂණය කිරීමේ හා ඇගයීමේ ක්‍රියාවලියයි. අභ්‍යන්තර පාලනය ආයතනයේ මෙහෙයුම් අවදානම ගැන සලකා බැලේ.
3. **තොරතුරු හා සන්නිවේදනය** - අවදානම් හා පාලනයන් පිළිබඳ තොරතුරු අදාළ පාර්ශ්වයන්ට සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ක්‍රියාවලීන් හා ක්‍රියාපටිපාටීන් අභ්‍යන්තර පාලන පද්ධතීන්ගෙන් අවශ්‍ය කෙරේ.
4. **පාලන ක්‍රියාපටිපාටීන** - මේවා කිසියම් පාලන අරමුණක් සපුරාගැනීමේ අරමුණින් හඳුන්වාදී ඇති අභ්‍යන්තර පාලනයන්ය.
5. **සමීක්ෂණය** - අභ්‍යන්තර පාලනයන් හා අභ්‍යන්තර පාලන පද්ධතියේ අනෙකුත් සංරචකයන්හි සඵලදායීතාවය නිරන්තරයෙන් සමීක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් තිබිය යුතුය.

ඉදිරිපත් කිරීමේ කමිටුවේ (කොසෝ /COSO) අභ්‍යන්තර පාලන රාමුවට අනුව අභ්‍යන්තර පාලන පද්ධතියක් යනු :

- ආයතනයක පහත සඳහන් ක්ෂේත්‍රවල පරමාර්ථ ඉටුකරගැනීම පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාදීම සඳහා නිර්මාණය කරන ලද ක්‍රියාවලියකි.
  මේවා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමණාත්වය විසින් ක්‍රියාවට නංවන ක්‍රියාවලීන්ය

  - මෙහෙයුම් කටයුතුවලට සඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය
  - මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය
  - අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලතාවය

(b) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමේ මෙහෙයුම් වගකීම කළමණාකාරිත්වය වෙත පවරනු ලබන අතර කළමණාකාරත්වය විසින් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වගවිය යුතුය.

ආයතනයකට අභ්‍යන්තර පාලනයන් හඳුන්වාදීමේ වගකීම කළමණාකාරත්වය සතුය.

- කළමණාකාරත්වය විසින් අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම් අනුමත කළ යුතුය.
- පාලනයන් නිසිපරිදි ක්‍රියාත්මකවන බවට ඔවුන් තහවුරු විය යුතුය.
- පාලන සම්බන්ධ තොරතුරු අදාළ පුද්ගලයන්ට සන්නිවේදනය කෙරෙන බවට ඔවුන් තහවුරු විය යුතුය.
- ඔවුන් අභ්‍යන්තර පාලනයන්ගේ සඵලත්වය සමාලෝචනය කර ඒ පිළිබඳව විගණන කමිටුවට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළයුතුය.

අභ්‍යන්තර පාලන පද්ධති සම්බන්ධයෙන් කළමණාකාරත්වයේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පමණක් වන අතර සමාගමේ කොටස් හිමියන් වෙත වගකීමක් නැත.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුර 04

ඉගෙනුම් ඵලය: 3.4.1, 4.2.3
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 274, 251-252

(a) **අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු :**

(i) <u>රාජකාරි බෙදාවෙන්කිරීමක් නොමැතිකම,</u> <u>විකුණුම් කළමණාකරු විසින් විකුණුම් ඇණවුම්, බෙදාහැරීමේ නියෝජිතයන්ගේ ණය සීමාවන් සහ විකුණුම් ඉන්වොයිස් අනුමත කිරීම,</u> මෙහි ප්‍රතිඵලයන් ලෙස සොයා නොගැනුන වැරදි ඇතිවීමට <u>හා වංචාවන් සඳහා</u> අවස්ථාවන් ඇතිවීමට අවකාශ ඇත.

(ii) දිගුකාලයක් හිඟව පවතින බෙදාහැරීමේ නියෝජිතයන්ගෙන් අයවිය යතු මුදල් පිළිබඳ සමීක්ෂණ නොකිරීම හා පසු විපරම් කිරීම් නොකිරීම හිඟ මුදල් නිරවුල් කරන තෙක් දිගින් දිගට ඔවුන් වෙත භාණ්ඩ ඉන්වොයිස් කිරීම වැලැක්වීම සඳහා පාලනයක් නොමැති වීම.

(iii) පිටත්කර හරිනු ලබන භාණ්ඩ ප්‍රමාණයන් ඉන්වොයිසියේ සඳහන් භාණ්ඩ සමඟ එකඟ වේදැයි බැලීම සඳහා භාණ්ඩ නිකුත් කිරීමේ පත්‍රයේ (GRN) සඳහන් ප්‍රමාණයන් බලයලත් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර නොබැලීම.

(iv) විකුණුම් විධායක විසින් ඉන්වොයිසි කර ඇත්තේ ඇණවුම් කරන ලද ප්‍රමාණයන් සඳහා ද යන්න සනාථ කරගැනීම සඳහා පාලනයක් නොතිබීම, එසේ නොමැතිවීමෙන් අඩුවෙන් හෝ වැඩියෙන් ඉන්වොයිස් නිකුත් කිරීම් කළහැකිය.

(b) (i) **ස්වයං ඇල්ම මත තර්ජනය.**

මෙයින් ස්වයං ඇල්ම මත තර්ජනයක් පැන නගී. යම් පුද්ගලයකුගේ පෞද්ගලික ඇල්මයන් එම පුද්ගලයාගේ සේවායෝජකයාගේ හෝ සේවාදායකයාගේ ඇල්මයන්ට වඩා වෙනස්වන විට මෙය හටගනී. ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් ඇගයීම සඳහා වූ ටෙන්ඩර් ඇගයීමේ කමිටුවේ සාමාජිකයකු ලෙස සුරාජ් සහභාගිවන්නේ නම් ඔහු ඔහුගේ මිතුරා කෙරෙහි පක්ෂපාතී වනු ඇත. එවිට ඔහුට එකිනෙකට වෙනස් ලැදියාවන් හෝ බැඳීම් දෙකක් ඇතිවේ. එනම් එකක් ඔහුගේ සේවායෝජකයා (employer) කෙරෙහිද අනෙක ඔහුගේ මිතුරා කෙරෙහිද වේ. මේවා එකිනෙක ගැටෙන සුළු ඇලුම් වේ.

(ii) **ත්‍යාග බාරගැනීම.**

ත්‍යාග බාරගැනීම මූල්‍ය කළමණාකරුගේ අරමුණුගතභාවය කෙරෙහි බලපෑමක් ඇති කරයි. එය ගණකාධිකාරීවරයකුගේ ස්වාධීනත්වය කෙරෙහි ඇතිවන සුලභ තර්ජනයකි. සුරාජ් ගේ තීරණවල අරමුණුගතභාවය කෙරෙහි බලපෑම් කිරීමට හෝ යම් ක්‍රියාවක් ඔහු ලවා කරවා ගැනීමට හෝ නොකරවා ගැනීමට දරණ උත්සාහයක් ලෙස විදේශීය ගැනුම්කරු විසින් සරාජ්ට ඉහළ අගයකින් යුත් යමක් ඔහු පිරිනමන්නට ඇත. ත්‍යාග පිරිනැමීම ස්වයං ඇල්ම හා බියගැන්වීමේ තර්ජනයක් පැන නැගීමට හේතුවන පෙළඹවීම් වේ.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුර 05

ඉගෙනුම් ඵලය: 5.3.1, 5.4.2	
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 312, 316-317	

(a)

ක්ෂේත්‍රය	උදාහරණය (ලකුණු 1 බැගින්)
විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලනිර්ණය හා තරම තීරණය කිරීමේදී, වෙනත් වචන වලින් කිවහොත් විගණනයකදී කුමන වැඩ කටයුතු ක්‍රියාවට නැංවිය යුතු දැයි අදහසක් ඇතිකර ගැනීමේදී	විකුණුම් මත කළ යුතු විගණන ක්‍රියාපටිපාටීන් තීරණය කිරීමේදී, විගණන ක්‍රියාපටිපාටීන් ගණන හා පරීක්ෂා කළයුතු නයැදි තරම සහ පරීක්ෂා කළයුතතේ අතුරු විගණනයේදී ද නැත්නම් අවසන් විගණනයේදීද යන්න තීරණය කිරීමේදී.
ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන තිබේද යන්න නිශ්චය කිරීමේදී.	විගණකට බැංකු ශේෂ සනාතකිරීමේ ලිපි ලැබී නැත. නමුත් විගණන සාක්ෂි ලෙස බැංක ප්‍රකාශයන් ලැබී ඇත. බැංකු ප්‍රකාශ ප්‍රමාණවත් හා <u>යෝග්‍ය</u> විගණන සාක්ෂියක් නොවන බව විගණක තීරණය කළේය.
අදාළවන මූල්‍ය වාර්තාකරණ රාමුව භාවිතා කිරීමේදී කළමණාකාරත්වය විසින් කරන ලද විනිශ්චයන් ඇගයීමේදී.	කළමණාකාරත්වය විසින් ගොඩනැගිලි වර්ෂ 5 ක් තුල ක්ෂය කර ඇත. විගණක මෙම තීරණය ඇගයීමට භාජනය කර ගොඩනැගිලිවල ප්‍රයෝජනවත් ජීවිතකාලය වර්ෂ 5 කට වැඩිබව තීරණය කරයි.
ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන නිගමනයන්ට එළඹීමේදී එනම් මතයකට එළඹීමේදී	ණයගැතියෙකු විසින් සනාථ කර ඇති ශේෂය හා ලෙජර ශේෂය, අතර ප්‍රමාණාත්මක වෙනසක් ඇති බැව් විගණක අනාවරණය කරගෙන ඇති අතර ඒ අනුව විගණන වාර්තාව තත්ත්වාගණනය කිරීමට තීරණය කරයි.

(b)

- තුන්වන පාර්ශ්වයන් විසින් කරන ලද සනාථ කිරීම්.
- රැස්වීම් වල වාර්තා.
- විමසීම, නිරීක්ෂණය සහ පරීක්ෂාකිරීම වැනි විගණන ක්‍රියාපටිපාටීන් වලින් තොරතුරු ලබා ගැනීමෙන්.
- තරඟකාර සමාගම්වල සැසඳිය හැකි දත්ත පරීක්ෂාව.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

පිළිතුර 06

ඉගෙනුම් ඵලය: 2.2.1/2.2.3
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක:114-129, අතිරේක අධ්‍යායන උපකාරකය 43-52

(a) දුර්වලතාවය	(b) අවදානම
රාජකාරි බෙදාවෙන් කිරීමක් නැත. පැමිණීම ලකුණු කිරීම හා වැටුප් පැකට්ටු බෙදා දීම අධීක්ෂක විසින්ම ඉටුකිරීම.	• කම්කරුවන්ට වැඩියෙන් ගෙවීම් කිරීමේ හැකියාව ඇත. • ඇත්ත වශයෙන් සේවය නොකරන පුද්ගලයන්ට වැටුප් ගෙවීමේ හැකියාව • වැටුප් ලේඛන නිලධාරියාට වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අවදානම
හිමිකම් නොපෑ වැටුප්, සේවකයන් විසින් අත්සන් කළ වැටුප් ලේඛන සමඟ වැටුප් ලේඛන නිලධාරියා වෙත බාර නොදීම.	• ඇත්ත වශයෙන් සේවය නොකරන පුද්ගලයන්ට වැටුප් ගෙවීම • වැටුප් ලේඛන නිලධාරියා වෙත වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අවදානම • මුදල් වංචා කිරීම.
හිමිකම් නොපෑ වැටුප් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල නොකිරීම හා හිමිකම් නොපෑ වැටුප් පසුව ලබාගෙන ඇති අවස්ථා බලයලත් තැනැත්තකු විසින් පරීක්ෂා නොකිරීම.	• ඇත්ත වශයෙන් සේවයේ යෙදී නොසිටින පුද්ගලයන්ට වැටුප් ගෙවීම. • වැටුප් ලේඛන නිලධාරියා වෙත වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අවදානම. • මුදල් වංචා කිරීම.
වැටුප් පිළියෙල කිරීම අදාළ බලය පවරන ලද නිලධාරියා විසින් අනුමත කර නොතිබීම.	• කම්කරුවන්ට වැඩියෙන් ගෙවීමේ හැකියාව ඇත. • ඇත්ත වශයෙන් සේවයේ යෙදී නොසිටින පුද්ගලයන්ට වැටුප් ගෙවීම. • වැටුප් ලේඛන නිලධාරියා වෙත වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමේ අවදානම. • මුදල් වංචා කිරීම.
සියළුම වාර්තා හස්ත ක්‍රමයට පවත්වාගන්නා තත්ත්වයක් යටතේ බලයලත් තැනැත්තකු විසින් ඒවා හරිවැරදි බැලූ බවට කිසියම් හෝ සටහනක් නොතිබීම.	• සාවද්‍ය වැටුප් පිරිවැය • ලේඛන වෙනස් කිරීමෙන් වංචා සිදුකිරීම • ඇත්ත වශයෙන් සේවයේ යෙදී නොසිටින පුද්ගලයන්ට ගෙවීම් කිරීම.

(c)

- වැටුප් පැකට්ටු බෙදාදීම අධීක්ෂක හැර වෙනත් වගකිය යුතු පුද්ගලයකු විසින් සිදුකිරීම.
- කම්කරුවන් විසින් අත්සන් කරන ලද වැටුප් ලේඛනය සමඟ හිමිකම් නොපෑ වැටුප්, වැටුප් ලේඛන නිලධාරියා වෙත බාරදීම.
- වැටුප් ලේඛන නිලධාරියා විසින් හිමිකම් නොපෑ වැටුප් ලැයිස්තුව පිළියෙල කර හිමිකම් නොපෑ වැටුප් පැකැට්ටු ආරක්ෂිත ස්ථානයක තැන්පත් කිරීම.
- පසුව වැටුප් ලබාගන්නා අවස්ථාවලදී හිමිකම් නොපෑ වැටුප් ලැයිස්තුව යාවත්කාලීන කරනු ලබන අතර එවැනි පසුව කරන ගෙවීම් බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කළයුතුය.
- පිළියෙලකරන ලද වැටුප් ලේඛනය එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා බලයලත් නිලධාරියකු විසින් පරීක්ෂා කළයුතුය.
- සතිපතා වන වැටුප් සැසඳුම පිළියෙල කළ යුතු අතර ඒවායේ නිර්වද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරු කරගැනීම සඳහා සමාලෝචනය කළ යුතුය.

(මුළු ලකුණු 10)

NOT FOR SALE

3 කොටස

පිළිතුර 07

ඉගෙනුම් ඵලය: 2.1.1 ,2.1.2, 2.1.3, 2.5.1, 2.5.2
අධ්‍යයන ග්‍රන්ථයේ යොමුව: පිටු අංක: 97, 98-100, 79-81, 217, 208-211 අතිරේක අධ්‍යයන උපකාරකය පිටු අංක: 69-71, 29-30, 41-44

(a)

තොග රඳවාගැනීමේ පිරිවැය	**තොග ඇණවුම් කිරීමේ පිරිවැය**
බැංකු අයිරා මත පොලිය	අතිරේක නැව්ගත කිරීමේ වියදම්
ඉඩම සඳහා කුලිය	වානේ සඳහා ඉහළ මිලගණනක් ගෙවීම
	අතිරේක පරිපාලන වියදම්

(b)

ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) යනු තොග වශයෙන් ඇණවුම් කිරීමේදී වට්ටම් නොලැබෙන තත්ත්වයක් යටතේ තොග පිරිවැය අවම කරගැනීම සඳහා ඇණවුම් කළ යුතු ප්‍රමාණයයි. ආර්ථික ඇණවුම් ප්‍රමාණය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කිරීමෙන් ගණනය කළහැකිය.

$$\mathbf{EOQ} = \sqrt{\frac{2C_0D}{C_H}}$$

Co = සැපයුම්කරුවකුට ඇණවුමක් නිකුත් කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය.

C_H = යම් තොග ඒකකයක් වර්ෂයක් සඳහා ගබඩාවේ රඳවාගැනීම සඳහා දැරීමට සිදුවන රඳවාගැනීමේ පිරිවැය.

D = වර්ෂයක් සඳහා තොග අයිතමය සඳහා ඇති ඉල්ලුම (ඒකක වලින්)

(c) **ව්‍යාපාරික අවදානම්**	(d) **පාලනය**
තොග සඳහා වන භෞතික අවදානම්	සුදුසු ගබඩා පහසුකම් සැලසීම / රක්ෂණය
වැදගත් තොග අයිතමයක් තොගයේ නොමැති තත්ත්වයක් ඇතිවීමේ අවදානම	අවම තොග මට්ටම් යලි ඇණවුම් නිශ්චය කිරීම
වැඩිමනත් තොග මට්ටම් පැන නැගීම	උපරිම තොග මට්ටම් නිශ්චය කිරීම
පිළිගැනීම කෙරෙහි ඇතිවන අවදානම	ප්‍රමිත නිෂ්පාදන මිශ්‍රණයක් පවත්වා ගැනීම
නඩුහබවලට මුහුණ පෑමේ අවදානම	නිෂ්පාදනයේ ගුණාත්මකභාවය (quality) පවත්වා ගැනීම.

NOT FOR SALE

(e)

- සැපයුම්කරු විශ්වාසදායකද යන්න, අවශ්‍යවන ප්‍රමාණයන්ගෙන් වානේ නිෂ්පාදනය කිරීමට එම සැපයුම්කරුට හැකියාව තිබේද?
- සැපයුම්කරු මූල්‍ය වශයෙන් ස්ථාවරද? සැපයුම්කරු බුන්වත් වීමේ අවදානමක් පවතීද ? (සහ ඒ නිසා වානේ සැපයීමට නොහැකිවේද ?)
- අවශ්‍යකරන ප්‍රමිත තත්ත්වයෙන් යුත් වානේ සැපයීමට සැපයුම්කරුට හැකියාව තිබේද?

(f)

- අවශ්‍යවන ප්‍රමාණයෙන් භාණ්ඩ සැපයීමට සැපයුම්කරු අපොහොසත් වීම.
- අවශ්‍ය ගුණත්වයෙන් යුත් භාණ්ඩ සැපයීමට සැපයුම්කරු අපොහොසත් වීම.
- වැඩිමිලකට භාණ්ඩ ඇණවුම් කිරීමේ හැකියාව (උදා. විනිමය අනුපාතිකය ඉහළයාම)
- එක සැපයුම්කරුවකු මත රදා පැවතීම
- වසර ආරම්භයේ දී ස්ථිර ගැණුම් මිලක් තීරණය කිරීම.

(g)

නෞභාර පත්‍රය

නෞභාර පත්‍රය යනු වාහකයා (carrier) විසින් නැව්ගත කළයුතු භාණ්ඩ තොගය ලැබුණ බවත් එම භාණ්ඩ නියමිත ගමනාන්තයකට යාමට සූදානම් නියමිත නැවකට, පැටවූ බවත් පිළිගනිමින් නැව්ගත කරන්නා වෙත නිකුත් කරන ලියවිල්ලකි.

නෞභාර පත්‍රය කාර්යයන් තුනක් ඉටුකරයි.

- එහි විස්තර සඳහන් භාණ්ඩ වාහකයා විසින් බාරගත් බවට සාක්ෂියක් සපයයි. (සහ එය නැව්ගත කළ නෞභාර පත්‍රයක් නම් අදාළ භාණ්ඩ නැව්ගත කළ බවට)
- භාණ්ඩ ප්‍රවාහනයට අදාළ ගිවිසුම සහ එහි අඩංගු වන භාණ්ඩ ගෙනයාමේදී අදාළවන කොන්දේසි වලට සාක්ෂියක් ලෙස යොදා ගැනීම එය නැව්ගත කළ භාණ්ඩ සඳහන් හිමිකම් පත්‍රයක් ලෙස යොදාගත හැකිය.
- නැව්ගත කළ භාණ්ඩ වල අයිතිය ප්‍රකාශ කරන ලියවිල්ලක්

එබැවින් නෞභාර පත්‍රය වාහකයා වෙත භාණ්ඩ බාරදුන් අවස්ථාව සනාථ කිරීමට සාක්ෂියක් ලෙස යොදාගත හැකි ලියවිල්ලක් වේ. ගැණුම්කරු වෙත අවදානම මාරුවීමේ සලකුණක් වේ.

(මුළු ලකුණු 20)

NOT FOR SALE

නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම~" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු~" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සදු නොකළ යුතුය.